අමාත්‍යාංශ චක්‍රලේඛ – 95 – 7V111

මගේ අංකය: 4/ගුරුආ/1/3099

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,

'ඉසුරුපාය'

බත්තරමුල්ල.

1996.02.06

සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට හා

කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට.

අධ්‍යාපන වේදී උපාධිය දරණ ගුරුවරුන්ට නව ගුරු සේවා
වාවස්ථා සංග්‍රහය යටතේ වැටුප් සකස් කිරීම

අධ්‍යාපනවේදී උපාධිය සම්පූර්ණ කරන ලද සමාජ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුවරුන්ගේ වැටුප් නව ගුරු සේවා වාවස්ථා සංග්‍රහය යටතේ පරිවර්තනය කිරීම පිළිබඳව ගැටළු ඇති වී ඇති බව වාර්තා වී ඇත. මෙම උපාධිධාරීන් සම්බන්ධයෙන් ද මගේ චක්‍රලේඛ අංක 95/7(111) අදාළ වන අතර, ඔවුන් උපාධි ගුරුවරුන් සේ සලකනු ලැබීමට පදනම් වූ සහතිකය මත ඔවුන්ට ගුරු පත්වීම් ලබා දී ඇති දින සිට උපාධිධාරීන් සේ සලකා වැටුප් සකස් කළ යුතුය. එම උපාධිය අධ්‍යාපනවේදී උපාධියක් වන්නේ නම් මෙම ගුරු පිරිස වෘත්තිය සුදුසුකම් සහිත උපාධිධාරීන් වශයෙන් සැලකිය යුතුය.

සේනානායක උපසේන

අතිරේක ලේකම්(පාලන)

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම් වෙනුවට

එස්/05.